## අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

# පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

කාර්ය සාධන වාර්තාව - 2018


පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
10 වන මහල,"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල

දුරකතන -0115226100 ෆැක්ස් - 0112862290 විද්‍යුත් තැපැල් ලිපිනය - info@drp.gov.lk

## පටුන

ඡායාරූප ලැයිස්තුව ........ iv

වගු හා ප්‍රස්ථාර ලැයිස්තුව ........ v

දැක්ම ........ vi

මෙහෙවර........ vi

1. දෙපාර්තමේන්තුව පිළිබඳව ........ 1

1.1. හැඳින්වීම ........ 1

1.2. පිහිටීම........ 1

1.3. ප්‍රධාන කාර්ය භාරය ........ 2

1.4. දෙපාර්තමේන්තුවේ වගකීම ........ 2

2. හැඳුනුම්පත් සකස් කිරීමේ ක්‍රියාවලියේ විකාශනය ........ 3

2.1. ශ්‍රී ලංකාව තුළ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කිරීම. ........ 3

2.2. ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම. ........ 3

2.2.1. පරිගණක අනුසාරයෙන් අංක යෙදීම. ........ 3

2.2.2. පරිගණකගත ක්‍රමවේදයක් භාවිතයෙන් ජාතික හැඳුනුම්පත් සකස් කිරීම. ........ 3

2.2.3. දෙපාර්තමේන්තු වාර්තා පරිගණකගත කිරීම. (සුවිපත්) ........ 3

2.3. ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම........ 4

2.3.1.සිංහල සහ දෙමළ භාෂා දෙකෙන් යුතුව මුද්‍රණය කරන ලද පරිගණකගත හැඳුනුම්පතක් හඳුන්වාදීම........ 4

2.3.2. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම සමන්විත ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම........5

2.4. නව ජාතික හැඳුනුම්පත සඳහා ICAO ප්‍රමිතියෙන් යුත් ඡායාරූපකරණය හඳුන්වාදීම........ 5

3. ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ත ප්‍රගතිය ........ 6

3.1. සාමාන්‍ය සේවය ........ 7

3.2. එක්දින සේවය ........ 8

3.3. ජංගම සේවය ........ 9

4. මූල්‍ය ප්‍රගතිය ........ 10

4.1. වියදම් ඇස්තමේන්තුව හා සත්‍ය වියදම........ 10

4.2. ආදායම් ඇස්තමේන්තුව හා ආදායම් ප්‍රගතිය ........ 11
5. නීතිමය කටයුතු ........ 12
6. නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු හා ප්‍රගතිය ........ 14
7. අභ්‍යන්තර විගණනය ........ 16
8. දිරි දීමනා ........ 16
9. කාර්ය මණ්ඩල තොරතුරු ........ 17
9.1. නව පත්වීම් ........ 18
9.2. ඉල්ලා අස්වීම් ........ 18
9.3. ස්ථාන මාරුවීම් ........ 18
9.4. මුදා හැරීම් ........ 19
9.5. උසස් වීම් ........ 19
9.6. මිය යාම් ........ 19
9.7. විශ්‍රාම ගැනීම් ........ 19
9.8. සේවය අතහැර යාම් ........ 19
10. ඉඩම්, ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් ........ 20
11. දෙපාර්තමේන්තුවට අයත් වාහන ........ 22
12. විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය ........ 23
12.1. ව්‍යාපෘතියේ ඉදිරි දැක්ම ........ 23
12.2. 2018 වසර සඳහා වෙන් වූ ප්‍රතිපාදන ........ 23
12.3. මූල්‍ය ප්‍රගතිය ........ 24
12.4. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය ........ 25

## ඡායාරූප ලැයිස්තුව

ඡායාරූපය 1 : දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ල................. 1

ඡායාරූපය 2: ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ................................ 3

ඡායාරූපය 3 : සිංහල භාෂාවෙන් පමණක් ලියා නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත..................... 4

ඡායාරූපය 4 : පරිගණකගත ක්‍රමවේදය ඔස්සේ ද්විභාෂාවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.4

ඡායාරූපය 5 : පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් ව්යානි ගුණතිලක මහතා විසින් උත්සව සභාව ආමන්ත්‍රණය කිරීම.............................................................................................. 5

ඡායාරූපය 6 :භාෂා ත්‍රිත්වයෙන් සමන්විත නව ජාතික හැඳුනුම්පත (සුහුරු කාඩ්පත) ...................... 5

ඡායාරූපය 7 : ජනාධිපති නිල මෙහෙවර සේවා වැඩසටහනකදී ගරු අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමා විසින් උත්සව සභාව ඇමතීම9

ඡායාරූපය 8 : දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටුවා ඇති බත්තරමුල්ල “සුහුරුපාය” ගොඩනැගිල්ල ........................................................................................................... 20

ඡායාරූපය 9 : දෙපාර්තමේන්තුවේ මධ්‍යම පළාත් කාර්යාලය ඉදිකිරීම සඳහා නුවරඑළිය ප්‍රදේශයේ වෙන් කර ඇති ඉඩම ........................................................................................................ 20

ඡායාරූපය 10 : දෙපාර්තමේන්තුවේ එක්දින සේවය ............................................................. 21

## වගු හා ප්‍රස්ථාර ලැයිස්තුව

වගුව 1 : 2018 වර්ෂයේදී ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ත ප්‍රගතිය................................ 6

වගුව 2: සාමාන්‍ය සේවය යටතේ 2018 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා එක් එක් මාසය තුල ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව…………….................................................................…. 7

වගුව 3 : එක්දින සේවය යටතේ 2018 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා එක් එක් මාසය තුල ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව ...................... 8

වගුව 4 : ජංගම සේවා වැඩසටහන් යටතේ 2018 වර්ෂයේදී ලද ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව..................... 9

වගුව 5 : වියදම් ඇස්තමේන්තුව හා සත්‍ය වියදම.................................................................... 10

වගුව 6 : ආදායම් ඇස්තමේන්තුව හා ආදායම් ප්‍රගතිය.............................................................. 11

වගුව 7 : 2018 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකළ නීතිමය කටයුතු හා එහි ප්‍රගතිය .. 13

වගුව 8 : 2018 වර්ෂය තුල සිදුකළ නිලධාරීන් පුහුණු කිරීම් හා ප්‍රගතිය ...................................... 15

වගුව 9 : 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය.......................................................................... 17

වගුව 10 : දෙපාර්තමේන්තුවට අයත් වාහන............................................................................ 22

වගුව 11 : 2018 වසර සඳහා විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියට වෙන් වූ ප්‍රතිපාදන ............... 23

වගුව 12 : 2018 වසරේ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය............................. 24

වගුව 13 : 2018 වසරේ ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය .................................................. 28

ප්‍රස්ථාරය 1 : සාමාන්‍ය සේවය යටතේ 2018 වර්ෂයේදී ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව......................................................................................... 7

ප්‍රස්ථාරය 2 : එක්දින සේවය යටතේ 2018 වර්ෂයේදී නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව ....... 8

ප්‍රස්ථාරය 3 : 2018 වර්ෂයේදී පවත්වන ලද ජංගම සේවාවන් හා ලැබූ අයදුම්පත් සංඛ්‍යාව ............. 9

ප්‍රස්ථාරය 4 : 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය ....................................................................... 11

## දැක්ම

*සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුටම තහවුරු කරන ලද අනන්‍යතාවක්.*

## මෙහෙවර

*සිය දේශය තුළදී සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ මානව, සමාජ, ආර්ථික, දේශපාලනික සහ නීතිමය අයිතිවාසිකම් සුරැකෙන අයුරින් ද, සිය දේශයෙන් බැහැර වූ අවස්ථාවල ආරක්ෂාව සැලසෙන අයුරින්ද ඔවුන්ගේ තොරතුරු ඇතුළත්කොට ජාතික පුද්ගල දත්ත පද්ධතියක් සකස් කිරීම, කිසියම් පුරවැසියකුගේ අනන්‍යතාව තහවුරු කර ගතයුතු අවස්ථාවල දී ජාතික හා අනෙකුත් ආයතනවලට තොරතුරු සැපයීම සහ ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට හා සංවර්ධනයට සහාය වීම.*

# 1. දෙපාර්තමේන්තුව පිළිබඳව

## 1.1. හැඳින්වීම

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් 1972 වර්ෂයේ සිට වයස අවුරුදු 18 ඉක්ම වූ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදී. අනතුරුව, 2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ විධිවිධාන ප්‍රකාරව 2016 ජූලි 07 වන දින සිට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ වයස් සීමාව අවුරුදු 15 ලෙස සංශෝධනය කරන ලදී.

## 1.2. පිහිටීම

ආරම්භයේ පටන් කොළඹ 05, කැප්පෙටිපොළ පාර, අංක 38 ලිපිනයෙහි පිහිටුවා තිබූ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය 2016 සැප්තැම්බර් 26 දින සිට බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ “සුහුරුපාය” ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කර ඇත.




ඡායාරූපය 1 : දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ල

## 1.3. ප්‍රධාන කාර්ය භාරය

- සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුගේම පුද්ගල තොරතුරු රැස්කර ජාතික පුද්ගල තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර පවත්වාගෙන යාම.

- සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ට ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම.

- ජාතික බුද්ධි හා ආරක්ෂක අංශවලට අවශ්‍ය වූ විට පුද්ගලයන් පිළිබඳ තොරතුරු විමර්ශනයකිරීම, සහතික කිරීම සහ තොරතුරු හා දැනුම හුවමාරු කර ගැනීම.

## 1.4. දෙපාර්තමේන්තුවේ වගකීම

- සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුගේම පුද්ගල තොරතුරු රැස්කර ජාතික පුද්ගල දත්ත ගබඩාවක් ස්ථාපිත කර පවත්වාගෙන යාම.

- නිසි වයස සම්පූර්ණ වූ සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුම ලියාපදිංචි කර, ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම.

- ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ පුද්ගල තොරතුරු තහවුරු කර සහතික කිරීම.

- රාජ්‍ය හා අනෙකුත් ආයතන සමග තොරතුරු හා දැනුම හුවමාරු කර ගැනීම.


- නූතන තාක්ෂණික දැනුම හා මානව සම්පත් සංවර්ධනය තුළින් දෙපාර්තමේන්තුවේ ශක්‍යතාවය ගොඩනැගීම.

- ජාතික ආරක්ෂාවට හා රටේ සංවර්ධන ක්‍රියාවලියට සහායවීම.

## 2. හැඳුනුම්පත් සකස් කිරීමේ ක්‍රියාවලියේ විකාශනය

### 2.1. ශ්‍රී ලංකාව තුළ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කිරීම.

1968 අංක 32 දරන පුද්ගලයන්ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුවඅවුරුදු 18 ඉක්මවූ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම 1972 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී.




ඡායාරූපය 2:ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

### 2.2. ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම.

#### 2.2.1. පරිගණක අනුසාරයෙන් අංක යෙදීම.

දෙපාර්තමේන්තුව ආරම්භයේ දී පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා අංක යෙදීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අංක පොත් අනුසාරයෙන් සිදුකරන ලදී.එහිදී, ඇති වූ දෝෂයන් මගහරවා ගැනීම සඳහා පරිගණක අනුසාරයෙන් අංක යෙදීම 2007 ජනවාරි 01 වන දින සිට ආරම්භ කරන ලදී.

#### 2.2.2. පරිගණකගත ක්‍රමවේදයක් භාවිතයෙන් ජාතික හැඳුනුම්පත් සකස් කිරීම.

පරිගණකගත ක්‍රමවේද භාවිතයෙන් සිංහල සහ දෙමළ, ද්වී භාෂාවෙන්ම මුද්‍රිත හැඳුනුම්පත් නිකුත් කිරීම 2014 පෙබරවාරි මස 28 දින සිට ආරම්භ කරන ලදී.

#### 2.2.3. දෙපාර්තමේන්තු වාර්තා පරිගණකගත කිරීම. (සුචිපත්)

නැතිවූ හැඳුනුම්පත් සඳහා අනුපිටපත් නිකුත් කිරීමේ දී සහ පවත්නා හැඳුනුම්පත් සංශෝධනය කිරීමේදී අවශ්‍ය වන පෙර හැඳුනුම්පත් පිළිබඳව වූ දෙපාර්තමේන්තු වාර්තා (සුචිපත්) සෙවීම, මුලදී මිනිස් ශ්‍රමය යොදා සිදු කෙරෙන කාර්යයක් විය. මේවන විට එම සුචිපත් පරිගණකගත කර ඇති බැවින් ඒවා පරිගණකය මගින් පරීක්ෂා කිරීම සිදු වේ.

## 2.3. ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම.


### 2.3.1. සිංහල සහ දෙමළ භාෂා දෙකෙන් යුතුව මුද්‍රණය කරන ලද පරිගණකගත හැඳුනුම්පතක් හඳුන්වාදීම.


සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන් හැඳුනුම්පත් ලියා නිකුත් කරන ලෙස ඉල්ලා ඉදිරිපත් කර තිබූ අංක SC Application No.93/2013 (F/R) දරන මානව හිමිකම් පෙත්සම් විභාගය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කරන තෙක්, 2014.01.01 දින සිට සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන් යුතුව හැඳුනුම්පත් නිකුත් කරන ලෙස නියෝග කර ඇත.



ඡායාරූපය 3 : සිංහල භාෂාවෙන් පමණක් ලියා නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

එතෙක් නිකුත් කරන ලද හැඳුනුම්පත අතින් ලියා එක් භාෂාවකින් පමණක් නිකුත් කරන ලද්දකි. හැඳුනුම්පත භාෂා දෙකකින් අතින් ලිවීමේ දී ඒ සඳහා ගත වන කාලය, පෙර එක් භාෂාවකින් පමණක් අතින් ලිවීම සඳහා ගත වන කාලය මෙන් දෙගුණයක් පමණ ගතවනු ඇත. එසේම ඒ සඳහා අවශ්‍ය වන නිලධාරීන් සංඛ්‍යාවද අති විශාලය. මේ සඳහා විසඳුමක් ලෙස වර්ෂ 2014 පෙබරවාරි 28 වන දින සිට පරිගණකගත ක්‍රමවේදයක් ඔස්සේ සිංහල හා දෙමළ ද්වි භාෂාවෙන්ම ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදී.




ඡායාරූපය 4: පරිගණකගත ක්‍රමවේදය ඔස්සේ ද්විභාෂාවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

### 2.3.2. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම සමන්විත ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම.

විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය යටතේ දියත් කරන ලද පළමු පියවර වශයෙන් මෙම දෙපාර්තමේන්තුවටම ආවේණික පරිගණකගත ක්‍රමවේදයක් හා ලේස(ර්) තාක්ෂණය උපයෝගී කර ගනිමින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම සමන්විත වන පරිදි අතිනවීන ජාතික හැඳුනුම්පතක් (සුහුරු කාඩ්පතක්) නිකුත් කිරීම 2017 ඔක්තෝබර් මස 27 වන දින සිට ආරම්භ කරන ලදී.



**ඡායාරූපය 5 : පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වියානි ගුණතිලක මහතා විසින් උත්සව සභාව ආමන්ත්‍රණය කිරීම**





**ඡායාරූපය 6:භාෂා ත්‍රිත්වයෙන් සමන්විත නව ජාතික හැඳුනුම්පත (සුහුරු කාඩ්පත)**

## 2.4. නව ජාතික හැඳුනුම්පත සඳහා ICAO ප්‍රමිතියෙන් යුත් ඡායාරූපකරණය හඳුන්වාදීම.

මෙම දෙපාර්තමේන්තුව විසින් ජාතික හැඳුනුම්පත සකස් කිරීමේ දී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා ප්‍රමිතීන්ට අනුකූලව ඡායාරූප ගැනීම ආරම්භ කරන ලදී. එහි සමාරම්භක වැඩපිළිවෙල 2018.10.01 දින කොමසාරිස් ජනරාල් පී.වියානි ගුණතිලක මහතාගේ මූලිකත්වයෙන් සිදුකරන ලද අතර, එම අවස්ථාවේදී ICAO මෘදුකාංගය, දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඡායාරූප ශිල්පීන් වෙත හඳුන්වාදෙන ලදී.

## 3. ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ත ප්‍රගතිය

මෙම දෙපාර්තමේන්තුව මගින් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම පහත සඳහන් පරිදි සේවා සැපයුම් ක්‍රම දෙකක් මගින් සිදුකරනු ලැබේ.




ඉහත ක්‍රම දෙක යටතේ දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ත ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.[1]
(ජංගම සේවා/ජනාධිපති නිල මෙහෙවර සේවා මගින් ලබාගත් අයදුම්පත් හා එම අයදුම්පත් සඳහා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සාමාන්‍ය සේවයට ඇතුලත් කර ඇත.)

| ලැබුණු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව | | නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව | |
|---|---|---|---|
| සාමාන්‍ය සේවය | එක්දින සේවය | සාමාන්‍ය සේවය | එක්දින සේවය |
| 764,827 | 321,585 | 760,913 | 329,458 |
| ලැබුණු මුළු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව | | නිකුත්කළ මුළු හැඳුනුම්පත් සංඛ්‍යාව | |
| 1,086,412 | | 1,090,371 | |
| නිකුත් කළ මුළු ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව (ප්‍රතිශතය) | | | |
| 100% | | | |

**වගුව 1: 2018 වර්ෂයේදී ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ත ප්‍රගතිය**

මෙම දෙපාර්තමේන්තුව සඳහා 2018 වර්ෂයේදී ලැබුණු මුළු අයදුම්පත් 1,086,412 සඳහා ජාතික හැඳුනුම්පත් 1,090,371ක ප්‍රමාණයක් නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ත ප්‍රගතිය විශ්ලේෂණාත්මකව පහත පරිදි දැක්විය හැකිය.


[1] **සැ.යු. - මෙම තොරතුරු දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය මගින් ලබාගත් දත්ත පදනම් කරගෙන සකස් කර ඇත.**

## 3.1. සාමාන්‍ය සේවය

සාමාන්‍ය සේවය යටතේ 2018 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා එක් එක් මාසය තුළ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව පහත වගුවෙන් දැක්වේ.[2]

| මාසය | සාමාන්‍ය සේවය යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | සාමාන්‍ය සේවය යටතේ නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 48,088 | 49,881 |
| පෙබරවාරි | 44,190 | 50,993 |
| මාර්තු | 78,042 | 32,547 |
| අප්‍රේල් | 63,431 | 6,229 |
| මැයි | 118,533 | 40,438 |
| ජූනි | 131,210 | 100,323 |
| ජූලි | 74,422 | 99,208 |
| අගෝස්තු | 46,867 | 110,457 |
| සැප්තැම්බර් | 43,897 | 84,596 |
| ඔක්තෝබර් | 42,141 | 84,903 |
| නොවැම්බර් | 36,832 | 55,736 |
| දෙසැම්බර් | 37,174 | 45,602 |
| එකතුව | 764,827 | 760,913 |

වගුව 2: සාමාන්‍ය සේවය යටතේ 2018 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා එක් එක් මාසය තුල ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව




ප්‍රස්ථාරය 1 : සාමාන්‍ය සේවය යටතේ 2018 වර්ෂයේදී ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව

[2].සැ.යු. - යම් මාසයන්හි දී ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවේ හා නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාවේ වෙනසට හේතු පහත සඳහන් වේ

- 2017 වසරේ හැඳුනුම්පත් නිකුත් කිරීමට ඉතිරි වූ ඉල්ලුම්පත් ප්‍රමාණය
- අඩුපාඩු සහිත ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම.
- උචිත නියමිත වයස සම්පූර්ණ නොවූ පුද්ගලයන් විසින් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම.
- ව්‍යාජ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම.


## 3.2. එක්දින සේවය

හදිසි අවශ්‍යතාවයන් සඳහා කඩිනමින් හැඳුනුම්පත් ලබාගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් වෙනුවෙන් එක් දිනක් තුළ හැඳුනුම්පත් නිකුත් කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් (එක් දින සේවය) 2003.09.01 දින සිට ආරම්භකර ඇත. මේ යටතේ එක් අයදුම්පතක් වෙනුවෙන් රු.500/- ක රජයේ අනුමත ගාස්තුවක් අයකරනු ලැබූ අතර 2015 ජූලි 01 දින සිට එක් දින සේවා ගාස්තුව රු.1000/- ක් ලෙස සංශෝධනය කරනු ලැබ ඇත.

එක් දින සේවා වැඩසටහන යටතේ 2018 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා එක් එක් මාසය තුල ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව පහත වගුවෙන් දැක්වේ.[3]

| මාසය | එක්දින සේවය යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | එක්දින සේවය යටතේ නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව | ලැබුණු ආදායම (රු) |
|---|---|---|---|
| ජනවාරි | 26,983 | 27,601 | 26,983,000.00 |
| පෙබරවාරි | 27,463 | 28,169 | 27,463,000.00 |
| මාර්තු | 24,721 | 25,339 | 24,721,000.00 |
| අප්‍රේල් | 18,229 | 18,826 | 18,229,000.00 |
| මැයි | 27,081 | 27,698 | 27,081,000.00 |
| ජුනි | 26,949 | 27,659 | 26,949,000.00 |
| ජූලි | 32,303 | 33,076 | 32,303,000.00 |
| අගෝස්තු | 33,458 | 34,249 | 33,458,000.00 |
| සැප්තැම්බර් | 24,992 | 25,669 | 24,992,000.00 |
| ඔක්තෝබර් | 29,377 | 30,064 | 29,377,000.00 |
| නොවැම්බර් | 25,251 | 25,801 | 25,251,000.00 |
| දෙසැම්බර් | 24,778 | 25,307 | 24,778,000.00 |
| එකතුව | 321,585 | 329,458 | 321,585,000.00 |

වගුව 3 : එක්දින සේවය යටතේ 2018 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා එක් එක් මාසය තුල ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව




ප්‍රස්ථාරය 2 : එක්දින සේවය යටතේ 2018 වර්ෂයේදී නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව

[3] **එක්දින සේවය යටතේ ලැබුණු අයදුම්පත් හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් අතර වෙනසට හේතු පහත ආකාරයෙන් දැක්විය හැකිය.**


- **සාමාන්‍ය සේවය යටතේ ලද අයදුම්පත් පසුව එක්දින සේවය යටතේ ඉදිරිපත් කිරීමේදී එම අයදුම්පත පළමුව සාමාන්‍ය සේවය යටතේ පද්ධතියට ඇතුලත්කර ඇති අතර ඒ සඳහා නිකුත් කරන හැඳුනුම්පත එක්දින සේවය යටතේ ඇතුලත් කිරීම.**
- **එක්දින සේවය යටතේ එක් අයදුම්පතකට නිකුත් කරන හැඳුනුම්පතක දෝෂ ඇති වුවහොත් එම අයදුම්පතටම නැවත නිවැරදිව සකස් කරන තවත් හැඳුනුම්පතක් නිකුත් කිරීම.**

## 3.3. ජංගම සේවය

ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත අනිවාර්ය කිරීමත් සමග ජංගම සේවා පැවැත්වීම වේගවත් කරන ලදී. මෙම ජංගම සේවා මගින් දුර බැහැර ප්‍රදේශවල සිටින ජනතාව වෙත ගොස් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාර ගැනීම සිදු කරනු ලබයි. ස්ථානීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද ජංගම සේවා වැඩසටහන් යටතේ 2018 වර්ෂයේදී ලද ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව 11,447ක් වන අතර එහි සාරාංශය පහත පරිදි වේ.

| ජංගම සේවාවන් පවත්වන ලද ආයතන | පවත්වන ලද ජංගම සේවාවන් සංඛ්‍යාව | ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| ජනාධිපති නිල මෙහෙවර සේවාවන් | 20 | 6,560 |
| රාජ්‍ය ආයතන | 14 | 1,767 |
| පාසල් හා විශ්ව විද්‍යාල | 4 | 1,015 |
| පුද්ගලික ආයතන | 10 | 2,105 |
| මුළු එකතුව | 48 | 11,447 |

වගුව 4: ජංගම සේවා වැඩසටහන් යටතේ 2018 වර්ෂයේදී ලද ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව




ප්‍රස්ථාරය 3 : 2018 වර්ෂයේදී පවත්වන ලද ජංගම සේවාවන් හා ලැබූ අයදුම්පත් සංඛ්‍යාව






ඡායාරූපය 7 :ජනාධිපති නිල මෙහෙවර සේවා වැඩසටහනකදී ගරු අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමා විසින් උත්සව සභාව ඇමතීම

## 4. මූල්‍ය ප්‍රගතිය

මෙම දෙපාර්තමේන්තුවේ 2018 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

### 4.1. වියදම් ඇස්තමේන්තුව හා සත්‍ය වියදම

| අංකය | වැය විස්තරය | ක්‍රියාකාරකම | වියදම් ඇස්තමේන්තුව 2018 (රු.දහස්) | ප්‍රගතිය (මූල්‍ය ප්‍රගතිය - රු. දහස්) | | % |
|---|---|---|---|---|---|---|
| | | **පුනරාවර්තන වියදම්** | | | | |
| 1 | | පුද්ගල පඩි නඩි | 628,100.00 | මූල්‍ය | 611,599.62 | 97 |
| | | | | භෞතික | - | - |
| 2 | | වෙනත් පුනරාවර්තන වියදම් | 399,488.00 | මූල්‍ය | 362,951.27 | 91 |
| | | | | භෞතික | - | - |
| | | **පුනරාවර්තන වියදම් එකතුව** | **1,027,588.00** | | **974,550.89** | 95 |
| | | **ප්‍රාග්ධන වියදම්** | | | | |
| | | **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | | |
| 3 | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2,500.00 | මූල්‍ය | 1,015.32 | 41 |
| | | | | භෞතික | 3 | 100 |
| 4 | 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,500.00 | මූල්‍ය | - | - |
| | | | | භෞතික | - | - |
| 5 | 2003 | වාහන | 1,000.00 | මූල්‍ය | 999.96 | 100 |
| | | | | භෞතික | 6 | 100 |
| | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| 6 | 2101 | වාහන අත්පත් කර ගැනීම් | 5,930.00 | මූල්‍ය | 5,930.00 | 100 |
| | | | | භෞතික | 1 | 100 |
| 6 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 4,300.00 | මූල්‍ය | 4,202.40 | 98 |
| | | | | භෞතික | 183 | 99 |
| 7 | 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,717.00 | මූල්‍ය | 2,669.38 | 98 |
| | | | | භෞතික | 50 | 100 |
| | | **මානව සම්පත් සංවර්ධනය** | | | | |
| 8 | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 3,000.00 | මූල්‍ය | 1,839.56 | 61 |
| | | | | භෞතික | 44 | 90 |
| | | **වෙනත් මූලධන වියදම්** | | | | |
| 9 | 2505 | ප්‍රසම්පාදනයට පෙර සූදානම | 175.00 | මූල්‍ය | 105.00 | 60 |
| | | | | භෞතික | 2 | 100 |
| 10 | 2509 | වෙනත් | 110,370.00 | මූල්‍ය | *38,912.48 | 35 |
| | | | | භෞතික | - | - |
| | | **ප්‍රාග්ධන වියදම් එකතුව** | **131,492.00** | මූල්‍ය | **55,674.09** | 42 |
| | | | | භෞතික | - | - |
| | | **මුළු එකතුව** | **1,159,080.00** | මූල්‍ය | **1,030,224.98** | 89 |

වගුව 5 : වියදම් ඇස්තමේන්තුව හා සත්‍ය වියදම

*කාඩ්පත් මුද්‍රණය සඳහා ඉන්ෆොමැටික්ස් ආයතනයට ගෙවීම = රු. 37,136,638.80
නව සුහුරු කාඩ්පත් රසායනාගාර පරීක්ෂාවට ගෙවීම = රු. 1,775,843.00


රු. 38,912,418.80

## 4.2. ආදායම් ඇස්තමේන්තුව හා ආදායම් ප්‍රගතිය

| ආදායම් ඇස්තමේන්තුව (රු.දහස්) | ප්‍රගතිය (රු.දහස්) | ප්‍රගතිය (%) |
|---|---|---|
| 425,000.00 | 422,242.76 | 99.35% |

| ක්‍රියාකාරකම | 2018.12.31 දිනට ප්‍රගතිය (රු) |
|---|---|
| එක් දින සේවා ආදායම | 321,585,000.00 |
| දඩ මුදල් හා අයදුම්පත් ගාස්තු | 93,766,685.00 |
| මුද්දර ආදායම | 6,891,081.00 |
| එකතුව | 422,242,766.00 |

වගුව 6: ආදායම් ඇස්තමේන්තුව හා ආදායම් ප්‍රගතිය




ප්‍රස්ථාරය 4 : 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

## 5. නීතිමය කටයුතු

ජාතික හැඳුනුම්පත් සම්බන්ධ නීතිමය කටයුතු සිදුකිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නීති අංශයක් ස්ථාපනය කර ඇත. 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත (2016 අංක 8 දරන සංශෝධිත පනත) අනුව එම අංශයෙන් සිදු කරනු ලබන කාර්යයන් පහත සඳහන් වේ.

- කිසියම් පුද්ගලයෙකු 2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතෙහි 44(1) අ, ආ, ඇ, ඈ සහ ඉ වගන්ති අනුව සිදුකර ඇති වැරදි සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා අදාළ නීති කටයුතු සිදු කිරීම.

- පනතෙහි 39 අ (1) වගන්තිය අනුව යම් තැනැත්තෙකු අදාළ නියමිත තොරතුරු ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දැනුම්දීමට කොමසාරිස් ජනරාල්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට ඇති බලතල ක්‍රියාත්මක කිරීම.

- 39 (ආ) වගන්තිය අනුව රජයේ නිලධාරියෙකු නිල කාර්යය ඉටු කිරීමේදී කරනු ලබන ඉල්ලීම මත යම් තැනැත්තෙකුගේ ජාතික හැඳුනුම්පතේ සඳහන් තොරතුරු වල සත්‍යතාවය සහතික කිරීම.

- 39 (ඇ) වගන්තිය අනුව අධිකාරියක් විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීම් මත ජාතික හැඳුනුම්පත දරන්නා පිළිබඳ විස්තර වල සත්‍යතාවය සහතික කිරීම.

ඒ අනුව 2018 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කළ නීතිමය කටයුතු හා එහි ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | ක්‍රියාකාරකම | ලද අයදුම්පත් / ලිපි | වැඩ අවසන් අයදුම්පත්/ ලිපි | මුළු ක්‍රියාකාරී අයදුම්පත්/ලිපි |
|---|---|---|---|---|
| 01 | ගැටලු සහිත අයදුම්පත්<br>i. ද්විත්ව අයදුම්පත් ඉදිරිපත් කිරීම. (මුල් අයදුම්පත් දෙකක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කිරීම)<br>ii. එකම හැඳුනුම්පත් අංකයට එකිනෙකට වෙනස් පුද්ගලයන්ගේ ඡායාරූප පැවතීම.<br>iii. සංශෝධිත අයදුම්පත් සමඟ විකෘති කරන ලද හැඳුනුම්පත් හා වෙනත් පුද්ගලයන්ට හිමි හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම.<br>iv. ව්‍යාජ උප්පැන්න සහතික ඉදිරිපත් කිරීම.<br>v. අයදුම්පත් සමඟ යොමුකෙරෙන සැක කටයුතු උප්පැන්න සහතික පරීක්ෂා කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්මේන්තුවට යොමුකිරීම. | 8,609 | 5,513 | 3,096 |

| | | | | |
|---|---|---|---|---|
| 02. | I. විදේශගත වී සිටින හෝ විදේශගත වීමට බලාපොරොත්තු වන අයට අවශ්‍ය පොලිස් නිෂ්කාශන සඳහා හැඳුනුම්පත් අංක තහවුරු කිරීම<br>II. හැඳුනුම්පත් අංක තහවුරු කිරීම් - ලිපි | 50,023<br><br>1,428 | 49,187<br><br>1,428 | 836<br><br>- |
| 03. | හැඳුනුම්පත් අංක තහවුරු කිරීම් | | | |
| | i. හැඳුනුම්පත් අංක තහවුරු කිරීමේ මහජන ඉල්ලීම් (මුල් අයදුම්පත් සඳහා) | 171 | 92 | 79 |
| | ii. ආරක්ෂක අංශ සඳහා<br>➢ (පොලිස් ස්ථාන, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්තවාදී විමර්ශන විමසීම්,පොලිස් පණිවිඩ) | 3,663 | 3,302 | 361 |
| | iii. රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා (රාජ්‍ය හා පෞද්ගලික බැංකු, කම්කරු දෙපාර්තමේන්තුව, අර්ථසාධක අරමුදල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, මැතිවරණ දෙපාර්තමේන්තුව) | 5,383 | 4,824 | 559 |
| | iv. විදේශීය නියෝජිත ආයතන සඳහා<br>➢ IOM, තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල | 34 | 34 | - |
| | v. අධිකරණ කටයුතු සඳහා කරනු ලබන හැඳුනුම්පත් විමසීම් | 113 | 87 | 26 |
| 04. | ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර හැඳුනුම්පත් සකස් කිරීම්, අදාළ අයදුම්පත් පිළිබඳව විධිමත් පරීක්ෂණ සිදුකිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, විශේෂ අපරාධ විමර්ශන අංශය හා වංචා විමර්ශන කාර්යාංශය වෙත යොමු කිරීම. | 54 | - | 54 |
| **මුළු එකතුව** | | **69,478** | **64,467** | **5,011** |

**වගුව 7 : 2018 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකළ නීතිමය කටයුතු හා එහි ප්‍රගතිය**

ඒ අනුව ලද මුළු නීතිමය ගැටළු සහිත අයදුම්පත් 69,478න් අයදුම්පත් 64,467ක කටයුතු අවසන් කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස 93%ක් වේ.

## 6. නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු හා ප්‍රගතිය

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරිමේ පනතට අදාළ සංශෝධන සිදුකිරීම, සංශෝධනය වන පනතට අනුරූපීව රෙගුලාසි සකස් කිරීම හා නියෝග නිකුත් කිරීම ඇතුළු නෛතිකමය කටයුතු සිදුකිරීම සහ දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අදාළ ප්‍රතිපත්තිමය සැලසුම් සකස් කිරීම සංවර්ධන හා පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ .

එමෙන්ම, දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්ය මණ්ඩල කාර්යසාධනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කිරීමට අදාළ මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමත් තොරතුරු දැනගැනිමේ පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමත් සංවර්ධන හා පර්යේෂණ අංශයේ කාර්ය භාරයන් වේ.

2018 වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුහුණු කිරීම් සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | පුහුණු වැඩසටහන | වියදම (රු.) | භෞතික ප්‍රගතිය (පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව) |
|---|---|---|---|
| 1 | රාජ්‍ය භාෂා පුහුණු කටයුතු (මූලික දෙමළ හා දෙමළ කථනය | 132,000.00 | 36 |
| 2 | ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු කටයුතු | 162,425.00 | 145 |
| 3 | කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන වැඩසටහන | 105,000.00 | 280 |
| 4 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් පුහුණු කිරීම | 133,030.00 | 242 |
| 5 | උසාවි රාජකාරි හා ප්‍රකාශ සටහන් කර ගැනීමේ පුහුණුව | 29,100.00 | 57 |
| 6 | දෙමළ මාධ්‍ය නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණුව | 49,545.00 | 21 |
| 7 | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන යටතේ විශිෂ්ඨ සේවාලාභී සත්කාරය පිළිබඳ වැඩසටහන | 252,740.00 | 326 |
| 8 | අල්ලස් හා දූෂණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | 179,500.00 | 330 |
| 9 | පොත් බැඳුම්කරුවන් පුහුණු කිරීම | 3,500.00 | 1 |
| 10 | රාජ්‍ය මූල්‍ය පිළිබඳ පුහුණු වැඩමුළුව | 76,060.00 | 125 |

| | | | |
|---|---|---|---|
| 11 | පරිපාලන නිලධාරීන් සතු වගකීම් හා කාර්ය භාරය පිළිබඳ පුහුණු වැඩමුළුව | 15,000.00 | 1 |
| 12 | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩමුළුව | 42,500.00 | 5 |
| 13 | විශ්‍රාම වැටුප් පිළිබඳ පුහුණුව | 15,000.00 | 3 |
| 14 | වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණුව | 25,500.00 | 3 |
| 15 | තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදන හා ඇගයීම් පිළිබඳ පුහුණුව | 59,500.00 | 7 |
| 16 | රියදුරු මහතුන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල නැංවීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 34,000.00 | 6 |
| 17 | කාර්යාල කාර්ය සහායකයින්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල නැංවීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 51,000.00 | 2 |
| 18 | මූලික විමර්ෂණ පිළිබඳ පුහුණුව | 34,000.00 | 4 |
| 19 | දෙදින සේවාරම්භක කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණුව | 25,500.00 | 3 |
| 20 | විගණන පනතේ වෙනස්වීම් පිළිබඳ වැඩමුළුව | 33,000.00 | 5 |
| 21 | විනය පිළිබඳ වැඩමුළුව | 42,150.00 | 47 |
| 22 | පශ්චාත් උපාධි සඳහා සහභාගි කරවීම | 180,250.00 | 1 |
| 23 | උසස් ජාතික ඩිප්ලෝමාව - දත්ත විශ්ලේෂණය හා සයිබර් විමර්ශනය | 120,000.00 | 1 |
| **2018 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා දරන ලද මුළු වියදම හා නිලධාරීන් සංඛ්‍යාව** | | **1,800,300.00** | **1,651** |
| **2018 වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන මුදල (රු.)** | | 3,000,000.00 | |
| **මූල්‍ය ප්‍රතිශතය** | | **60.01%** | |

**වගුව 8: 2018 වර්ෂය තුළ සිදුකළ නිලධාරීන් පුහුණු කිරීම් හා ප්‍රගතිය**

## 7. අභ්‍යන්තර විගණනය

මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2018 වර්ෂය තුළ දී පහත සඳහන් කාර්යයන් සිදුකර ඇත.

- 2018 වර්ෂයේ පැවැත්වූ එක් දින සේවාවන්හි දෝෂ සහිත හැඳුනුම්පත් පිළිබඳ දෛනිකව වාර්තා ඉදිරිපත් කිරීම.
- ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා එක් දින සේවාවේ දෝෂ සහිත හැඳුනුම්පත් පිළිබඳ මාසික වාර්තා ඉදිරිපත් කිරීම.
- අප්‍රේල් මස හා මැයි මස 01, 02, 03 දිනයන්හි සාමාන්‍ය සේවාවේ දෝෂ සහිත හැඳුනුම්පත් පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම.
- ජනවාරි මස කාර්ය මණ්ඩලයේ නිවාඩු පරීක්ෂාව.
- ජනවාරි මස සිට ඔක්තෝම්බර් මස දක්වා දෙපාර්තමේන්තු ගෙවීම් වවුචර් පරීක්ෂාව.
- ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ ගෙවීම් වවුචර් පරීක්ෂාව.
- ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා බැංකු සැසඳුම් පරීක්ෂාව.
- ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා දක්වා ගිණුම් සාරාංශ පරීක්ෂාව.
- 2018 වර්ෂයට අදාල විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 06 ක් පැවැත්වීම.
- පෙබරවාරි මස එක් දින සේවා ආදායම් පරීක්ෂාව.
- මාර්තු සහ අප්‍රේල් මාසයන්හි කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම් පරීක්ෂාව සිදුකිරීම.
- කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි ස්ථාපනය කර ඇති මෙම දෙපාර්තමේන්තු අනු කාර්යාලය පරීක්ෂා කිරීම.
- ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවාගැනීම් පරීක්ෂාව.

## 8. දිරි දීමනා

2003 වර්ෂයේ සිට අයදුම්කරුවන්ගේ ඉල්ලීම් මත එක් දිනක් තුළ දී හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා එක් දින සේවය ආරම්භ කර ඇත. මෙම එක් දින සේවා කාර්ය මණ්ඩලය සඳහා විධිමත් අනුමැතියක් සහිතව දිරි දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ. 2018 වර්ෂය තුළ දී ද මෙම දිරි දීමනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

## 9. කාර්ය මණ්ඩල තොරතුරු

මෙම දෙපාර්තමේන්තුව සඳහා 2018.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව 1,403ක් වන අතර දැනට සිටින කාර්ය මණ්ඩල සංඛ්‍යාව 1,261ක් වේ. එය පහත ආකාරයෙන් දැක්විය හැකිය.

| අනු අංකය | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය |
|---|---|---|---|---|---|
| 1 | කොමසාරිස් ජනරාල් | 1 | 1 | - | - |
| 2 | අතිරේක කොමසාරිස් ජනරාල් | 1 | 1 | - | - |
| 3 | කොමසාරිස් | 3 | 3 | - | - |
| 4 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - | - |
| 5 | නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් | 19 | 17 | 2 | - |
| 6 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | - | 1 | - |
| 7 | ගණකාධිකාරී | 2 | 1 | 1 | - |
| 8 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | - | - |
| 9 | නීති නිලධාරී | 1 | - | 1 | - |
| 10 | පරිපාලන නිලධාරී | 2 | 2 | - | - |
| 11 | භාෂා පරිවර්තක | 2 | 1 | 1 | - |
| 12 | බලාත්මක නිලධාරී[4] | 24 | 10 | 14 | - |
| 13 | සංවර්ධන නිලධාරී | 879 | 840 | 39 | - |
| 14 | උපාධිධාරී අභ්‍යාසලාභී[5] | - | 5 | - | - |
| 15 | කාර්මික නිලධාරී | 2 | - | 2 | - |
| 16 | කළමනාකරණ සහකාර | 282 | 243 | 39 | - |
| 17 | ද්විභාෂා ලිපිකරු | 15 | - | 15 | - |
| 18 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 12 | 7 | 5 | - |
| 19 | රියදුරු | 11 | 11 | - | - |
| 20 | රියදුරු (දෙපාර්තමේන්තුගත) | 2 | - | 2 | - |
| 21 | කාර්යාල කාර්ය සහායක | 93 | 74 | 19 | - |
| 22 | නිෂ්පාදන සහායක* | 30 | 30 | - | - |
| 23 | ලේඛන සහායක* | 8 | 8 | - | - |
| 24 | ලිපි සහායක (දෙපාර්තමේන්තුගත) | 5 | - | 5 | - |
| 25 | තාවකාලික දෙමළ ලිපිකරු (කොන්ත්‍රාත් පදනම මත) | 6 | 5 | 1 | - |
| | | 1,403 | 1,261 | 147 | - |

වගුව 9: 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය

[4]බලාත්මක නිලධාරී සේවය සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර ඇති බැවින් එම තනතුරේ ඇතිවන පුරප්පාඩු සඳහා ඉදිරියේදී සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කල හැකිය.

[5]මෙම උපාධිධාරී අභ්‍යාසලාභී පත්වීම් සියල්ල සංවර්ධන නිලධාරී තනතුරෙහි ස්ථිර කළ පසු සංවර්ධන නිලධාරී සංඛ්‍යාවට එකතු කරනු ලැබේ.

*මෙම තනතුරු දරන්නන් එම තනතුරු වලට පුද්ගලික වන සේ අනුමත කර ඇති අතර, එම තනතුරු අහෝසි වීමෙන් ඇතිවන පුරප්පාඩු සඳහා කාර්යාල කාර්ය සහායක තනතුරු සංඛ්‍යාවට එකතු විය යුතුය. ඒ අනුව මුළු කාර්යාල කාර්ය සහායක තනතුරු සංඛ්‍යාව 131 ක් විය යුතුය.

## 9.1. නව පත්වීම්

- උපාධිධාරි අභ්‍යාසලාභී නිලධාරින් 5
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 88

## 9.2. ඉල්ලා අස්වීම්

- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් 01
- කාර්යාල සේවක සේවයේ නිලධාරීන් 02
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් 02

## 9.3. ස්ථාන මාරුවීම්

- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 05ක් ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 02ක් ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරීන් 1ක් ස්ථාන මාරුව පැමිණ ඇත.
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් 09ක් ස්ථාන මාරුව පැමිණි අතර, නිලධාරීන් 05 ක් ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් 04ක් ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 02ක් ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් 23ක් ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 27ක් ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් 34ක් ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 17ක් ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- තොරතුරු තාක්ෂණ සහකාර සේවයේ නිලධාරීන් 04ක් ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 5ක් ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- කාර්යාල කාර්ය සහයක සේවයේ නිලධාරීන් 02ක් ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 03ක් ස්ථාන මාරු ලැබ ගොස් ඇත.

- රියදුරු සේවයේ නිලධාරීන් 02ක් ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 01ක් ස්ථාන මාරු ලැබ ගොස් ඇත.

## 9.4. මුදා හැරීම්

- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් 01ක්
- සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් 03ක්

## 9.5. උසස් වීම්

- කාර්යාල කාර්ය සහයක සේවයේ නිලධාරීන් තිදෙනෙකු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත.

## 9.6. මිය යාම්

- සංවර්ධන නිලධාරි සේවයේ එක් නිලධාරියෙක් සහ කාර්යාල කාර්ය සහයක සේවයේ නිලධාරියෙක් මිය ගොස් ඇත.

## 9.7. විශ්‍රාම ගැනීම්

- ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරීන් 02
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් 03
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් 02
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් 01
- රියදුරු සේවයේ නිලධාරීන් 01
- ලේඛන සහායක සේවයේ නිලධාරින් 02
- කාර්යාල කාර්ය සහායක සේවයේ නිලධාරීන් 02

## 9.8. සේවය අතහැර යාම්

- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් 01

## 10.ඉඩම්, ගොඩනැගිලි හා අනෙකුත් වත්කම්

- ආරම්භයේ පටන් 2016.09.25 දක්වා මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර තිබූ අංක 38, කැප්පෙටිපොල පාර, කොළඹ 05 දරන ගොඩනැගිල්ල අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙත පවරා දීමට කටයුතු සිදුකෙරෙමින් පැවතුන අතරතුර අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් එම පරිශ්‍රයේ දැනට පිහිටුවා ඇති අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව එම ස්ථානයෙන් ඉවත්වූ පසු එම ගොඩනැගිල්ල හා ඊට අයත් පරිශ්‍රය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත භාර දීමට පියවර ගන්නා ලෙස දැනුම්දී ඇත.

- මේ වන විට මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇති වර්ග අඩි 139,458කින් යුත් සුහුරුපාය ගොඩනැගිල්ල සඳහා මාසිකව රු 18,684,500.44ක මුදලක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ගෙවනු ලබයි.



ඡායාරූපය 8 : දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටුවා ඇති බත්තරමුල්ල "සුහුරුපාය" ගොඩනැගිල්ල

- මෙම දෙපාර්තමේන්තුවේ ශාඛා කාර්යාලයක් ඉදි කිරීම සඳහා නුවරඑළිය, හාවාඑළිය ප්‍රදේශයේ ලේඩිමැකලම් පාරේ හෙක්.0.1710කින් යුත් ඉඩමක් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබා ගෙන ඇති අතර දැනට එහි මධ්‍යම පළාත් කාර්යාලයස්ථාපිත කිරීම සඳහා සියළු කටයුතු සූදානම්කර ඇත. ඊට අදාල ප්‍රතිපාදන විදුලි ජාතික ව්‍යාපෘතිය මගින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර ඇත.



ඡායාරූපය 9 : දෙපාර්තමේන්තුවේ මධ්‍යම පළාත් කාර්යාලය ඉදිකිරීම සඳහා නුවරඑළිය ප්‍රදේශයේ වෙන් කර ඇති ඉඩම

- දෙපාර්තමේන්තුවේ අයදුම්පත් ගබඩා කිරීම සඳහා නුගේගොඩ පිහිටි වර්ග අඩි 12,180ක වපසරියකින් යුතු යමුනා ගොඩනැගිල්ල සියලු බදු මුදල් සහිතව මාසික කුලියට ලබා ගෙන ඇත.

- මෙම දෙපාර්තමේන්තුවේ උතුරුමැද පළාත් කාර්යාලය උතුරුමැද පළාතේ ස්ථාපිත කිරීම සඳහා පර්.40ක ඉඩම් කොටසක් නැගෙනහිර නුවරගම්පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වෙන්කර දීමට ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතින බව එම කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම්දී ඇත.

- මහජනයාට වඩාත් පහසු සේවාවක් ලබාදීමේ අරමුණින් සුහුරුපාය ගොඩනැඟිල්ලේ බිම් මහලේ මෙම දෙපාර්තමේන්තුවේ පිළිගැනීමේ කවුළුව 2018 වර්ෂයේදී ඉදිකරන ලදී.

- 2018 වසරේදී දෙපාර්තමේන්තුවේ 9 –A පර්යන්තයේ ප්‍රධාන පිවිසුම් දොරටුව දෙපස බිත්තියේ Cladding සවිකර ආවරණය කිරීම සිදු කරන ලදී.

- දැනට ස්ථාපිත කර ඇති ජල පෙරනවලට අමතරව තවත් ජල පෙරන දෙකක් 11-B පර්යන්තය තුළ හා පිවිසුම් මැදුර තුල 2018 වර්ෂයේදී සවිකර ඇත.










**ඡායාරූපය 10: දෙපාර්තමේන්තුවේ එක්දින සේවය**

## 11.දෙපාර්තමේන්තුවට අයත් වාහන

මෙම දෙපාර්තමේන්තුවට අයත් වාහන පිළිබඳව විස්තර පහත දක්වා ඇත.

| අනු අංකය | වාහන අංකය | වර්ගය | නම | මිලදී ගත් වර්ෂය | මිලදී ගත් වටිනාකම (රු) |
|---|---|---|---|---|---|
| 1 | WP PE - 1266 | TOYOTA | ඩබල් කැබ් රථය | 2012.06.12 | 7,500,000.00 |
| 2 | WP KB - 8577 | NISSAN | කාර් රථය | මුල් ලේඛන රා.ආ. අමාත්‍යාංශයේ ඇත. | 3,400,000.00 |
| 3 | WP NA - 2147 | MITSUBISHI | වෑන් රථය | 2007.12.17 | 4,450,000.00 |
| 4 | WP KX - 7866 | NISSAN | කාර් රථය | 2014.02.10 | 9,390,000.00 |
| 5 | WP PF - 7780 | MITSUBISHI | ඩබල් කැබ්රථය | 2015.01.29 | 6,390,000.00 |
| 6 | WP PC - 3265 | MAHINDRA | ඩබල් කැබ් රථය | 2011.08.18 රා.ආ අමාත්‍යාංශයෙන් ලබා ගත් වාහනයකි. | 2,627,353.00 |
| 7 | WP KP - 5832 | MAHINDRA | ජීප් රථය | 2006.05.24 රා.ආ අමාත්‍යාංශයෙන් ලබා ගත් වාහනයකි. | 4,587,528.00 |
| 8 | WP PB - 6775 | MITSUBISHI | වෑන් රථය | 2006.11.22 | 6,250,000.00 |
| 9 | WP PA - 9855 | MITSUBISHI | වෑන් රථය | 2006.05.24 | 4,250,000.00 |
| 10 | WP CAN - 7833 | NISSAN | කාර් රථය | 2015.12.18 | 5,795,000.00 |
| 11 | WP CAN - 6891 | NISSAN | කාර් රථය | 2015.12.18 | 5,795,000.00 |
| 12 | WP KF - 6282 | TATA | කාර් රථය | 2008.09.02 (2016.08.01 දින e – NIC ව්‍යාපෘතියෙන් මෙම දෙපාර්තමේන්තුව වෙතභාර දී ඇත.) | 1,935,000.00 |
| 13 | WP WP - 6059 | TVS | යතුරුපැදිය | 2011.05.31 | 104,496.00 |
| 14 | WP ND - 0435 | NISSAN | වෑන් රථය | 2017.08.31 දින දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. | මෙහෙයුම් කල්බදු ක්‍රමයයටතේ ලබා ගත් රථයකි. |
| 15 | WP LO - 2297 | MITSUBISHI | කෑ කැබ් රථය | 2018.12.05 | 5,930,000.00 |

**වගුව 10: දෙපාර්තමේන්තුවට අයත් වාහන**

## 12.විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය

### 12.1. ව්‍යාපෘතියේ ඉදිරි දැක්ම

I. පවුල් ඒකකයක් ලෙස පුද්ගල දත්ත එක්රැස් කිරීම හා වයස අවුරුදු 15 හා ඊට වැඩි සියළුම ශ්‍රී ලාංකික පුරවැසියනේගේ ජීව දත්ත, ජීවමිතික ලක්ෂණ හා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ ප්‍රමිතියට අනුකූල ඡායාරූප (International Civil Aviation Organization-ICAO) ඇතුලත් ජාතික පුද්ගල නාමලේඛනයක්, මධ්‍ය දත්ත පද්ධතියක් ලෙස ස්ථාපිත කිරීම.

II. පුද්ගලයාගේ අනන්‍යතාවය නිවැරදිව තහවුරුකරගත හැකි විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් අවුරුදු 15 හා ඊට වැඩි සියළුම ශ්‍රී ලාංකික පුරවැසියන්ට නිකුත් කිරීම.

III. මධ්‍යම දත්ත ගබඩාවේ තොරතුරු, නෛතික දත්ත හුවමාරු ප්‍රතිපත්තියක් ස්ථාපිත කර, අත්‍යවශ්‍ය ආයතන සමග හුවමාරු කර ගැනීම.

IV. ජාතික ආරක්ෂාව හා රටේ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නාවූ සැලසුම් සඳහා පහසුකම් සැලසීම.

### 12.2. 2018 වසර සඳහා වෙන් වූ ප්‍රතිපාදන

| මුළු ඇස්තමේන්තු ගත මුදල රු. | ව්‍යාපෘති කාලසීමාව | ඇස්තමේන්තු සැකසීම හා උපදේශනය | ප්‍රතිපාදන-2018 රු. |
|---|---|---|---|
| **මි.8,000.7** | 2015-2017(දීර්ඝ කිරීම 2017-2019) | කොළඹ හා මොරටුව විශ්වවිද්‍යාලය,<br>ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) | මි.1,300 |

**වගුව 11 : 2018 වසර සඳහා විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියට වෙන්වූ ප්‍රතිපාදන**

## 12.3. මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | සංශෝධිත මුළු ව්‍යාපෘති ඇස්තමේන්තුව | 2012 රු. මි. | 2013 රු. මි. | 2014 රු. මි. | 2015 රු. මි. | 2016 රු. මි. | 2017 රු. මි. | 2018රු. මි. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| භෞතික යටිතල පහසුකම් සංවර්ධනය | 456.26 | 31.64 | 23.14 | 88.65 | 19.73 | 156.07 | 141.54 | 18.20 | 478.97 |
| තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය | 1,907.00 | - | - | 2.63 | 0.08 | 182.20 | 29.52 | 159.79 | 374.22 |
| පුරවැසියන්ගේ දත්ත රැස්කිරීම | 954.43 | 0.35 | 28.02 | 407.30 | 8.98 | 1.27 | 5.35 | 6.21 | 457.48 |
| දත්ත විද්‍යුත්කරණය | 715.80 | - | - | | - | - | - | - | - |
| නව හැඳුනුම්පත් නිකුත් කිරීම | 2,775.00 | - | - | | - | 76.00 | 55.30 | 131.59 | 262.89 |
| ප්‍රාග්ධන වියදම් | 40.00 | 15.84 | 1.30 | 2.22 | - | - | - | - | 19.35 |
| දෙපාර්තමේන්තු ඒකක සහ දත්ත මධ්‍යස්ථානවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු | 673.06 | - | 23.36 | 25.14 | 6.75 | 8.42 | 20.63 | 55.03 | 139.33 |
| උපදේශක සහ සම්පත් දායක දීමනා | 62.04 | - | - | 12.24 | - | 12.08 | 5.28 | 4.83 | 48.94 |
| ව්‍යාපෘති කළමණාකරණය හා නියාමනය | 227.51 | 18.45 | 12.54 | 19.23 | 13.86 | 19.97 | 34.67 | 40.91 | 159.63 |
| අවිනිශ්චිත වියදම් | 189.59 | - | - | - | | - | - | - | - |
| එකතුව | 8,000.69 | 66.28 | 88.35 | 557.41 | 49.40 | 456.01 | 292.29 | 416.56 | 1,940.80 |

වගුව 12: 2018 වසරේ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය

## 12.4. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය

| ප්‍රධාන කාර්යය | භෞතික ප්‍රගතිය |
|---|---|
| **1.විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීමට අදාලව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතට අදාළ සංශෝධන සඳහා අනුමැතිය ලබා ගැනීම** | 1.1 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතට සිදුකරන ලද සංශෝධන සඳහා 2016.06.21 දින පාර්ලිමේන්තු අනුමැතිය ගෙන ඇත. |
| | 1.2 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතට සිදුකරන ලද සංශෝධන වලට අදාළ රෙගුලාසි සඳහා පාර්ලිමේන්තු අනුමැතිය 2017.08.22 දින ලබා ගෙන ඇත. |

| | |
|---|---|
| **2. විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීමට අදාලව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ඒකක 331 ස්ථාපිත කිරීම** | **2.1 ප්‍රාදේශිය ලේකම් කාර්යාල 331හි දෙපාර්තමේන්තු ප්‍රාදේශීය ඒකක, අවශ්‍ය උපකරණ සහිතව ස්ථාපිත කර ඇති අතර ඒ සඳහා නිලධාරීන් පුහුණුකර, අනුයුක්ත කර ඇත .** |
| | 2.2 ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුල ස්ථාපිත කරන ලද දෙපාර්තමේන්තු ඒකක 331 හා ප්‍රධාන කාර්යාලය සඳහා පරිගණක 1,067, මුද්‍රණ යන්ත්‍ර 382, පරිලෝකණ යන්ත්‍ර 368,UPS යන්ත්‍ර 712 හා ක්ෂණික ප්‍රතිචාර කේත කියවන (QR Readers) 712 ක් මිලදී ගෙන ඇත. |
| | 2.3.1. ප්‍රාදේශිය ලේකම් කාර්යාල 331 හි පිහිටි දෙපාර්තමේන්තු ඒකක වල සිට අයදුම්පත් විද්‍යුත්ව ප්‍රධාන කාර්යාලයට ලබා ගැනීමට ඇති සැලසුම අනුව VPN ජාලයක් මගින් ප්‍රධාන කාර්යාලයට සම්බන්ධ කර ඇත.<br><br>2.3.2. දෙපාර්තමේන්තු ඒකක වලින් VPN සබඳතාවය හරහා අයදුම්පත්වල තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත විද්‍යුත්ව ලබා ගැනීමේ වැඩසටහන මේ වනවිට උතුරු පළාතේ දිස්ත්‍රික්කවල හැර අනෙකුත් සියළුම දිස්ත්‍රික්කවල ආරම්භ කර සාර්ථකව ක්‍රියාත්මක වේ. උතුරු පළාත තුල මෙම කාර්යය 2019 ජනවාරි 31 දිනට පෙර ආරම්භ කිරීමට සියළු කටයුතු සූදානම් කර ඇත.<br><br>2.3.3. උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළව උතුරු පළාතේ හැරඅනෙකුත් සියලුම පළාත්වල ප්‍රාදේශිය ලේකම් වරුන් දැනුවත් කිරීම හා සංවර්ධන නිලධාරින් පුහුණු කිරීම මේ වන විට අවසන් කර ඇත. මෙම වැඩසටහනේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් අඛණ්ඩව වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. |

| | |
|---|---|
| | 2.4 වයස අවුරුදු 15 හා ඊට වැඩි පුරවැසියන්ගේ ජීවමිතික හා ජීවදත්ත රැස්කිරීමට (Data Capturing) අදාළ සන්නිවේදන ද්‍රව්‍ය හා උපකරණ(Information, Education, Communication Materials) සකස්කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත බෙදාහැර ඇත. |
| | 2.5 දත්ත රැස්කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය ඉල්ලුම්පත්, උපදෙස් පත්‍රිකා, ඇඟිලි සටහන් පත්‍ර හා උපකරණ, QR ස්ටිකර්ස් ප්‍රා.ලේ. කාර්යාල 331ටම බෙදාහැර ඇත. |
| | 2.6 දත්ත රැස් කිරීමේ කාර්යයට අදාළව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම මාණ්ඩලික නිලධාරියෙකු, සංවර්ධන නිලධාරීන් 662 දෙනෙකු, ග්‍රාම නිලධාරීන් 14,022 දෙනෙකුට දත්ත රැස්කිරීම පිළිබඳ පුහුණුව ලබා දී ඇත. |
| **3. පළාත් කාර්යාල ස්ථාපිත කිරීම** | 3.1 උතුරු, නැගෙනහිර, වයඹ, හා දකුණු පළාත් කාර්යාල ස්ථාපිත කර ඇත. මධ්‍යම පළාත් කාර්යාලය නුවරඑළිය දිස්ත්‍රික්කයේ ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට ප්‍රසම්පාදන ලියවිලි සකස්කර, ලංසු කැඳවා එම ලංසු ඇගයීම් කටයුතු සිදුකරමින් පවතී.<br>ඌව, සහ උතුරුමැද පළාත් කාර්යාල ස්ථාපිත කිරීම සඳහා සුදුසු ස්ථාන පරීක්ෂා කරමින් සිටී. |
| **4. ආපදා ප්‍රතිසාදන (DRDC) මධ්‍යස්ථානය කුරුණෑගල පිහිටුවීම** | 4.1 2016.07.12 දින අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ගනු ලැබූ තීරණයකට අනුව ආපදා ප්‍රතිසාදන (DRDC) මධ්‍යස්ථානය කුරුණෑගල පිහිටුවීම සඳහා කුරුණෑගල වැව්ලි සමාගමට අයත් ඉඩමෙන් අක්කර දෙකක ඉඩම් කොටසක් දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට එකගතාවය ලබා දී ඇත. ඒ අනුව 2017.09.29 දින අදාළ ඉඩම් කොටස මැන වෙන්කරන ලදී. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. ඊට අදාළව භාණ්ඩාගාරයේ නිර්දේශය මත හා 2018.07.11 දින දැනුම් දුන් පරිදි යෝජිත ඉඩමෙහි තක්සේරු වාර්තාව 2018.10.04 දින කුරුණෑගල තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගෙන ඇත.<br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ලබාදුන් උපදෙස් අනුව කෙටුම්පත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා 2018.10.26 දින අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත භාර දී ඇත. |

| | |
|---|---|
| **5. පවතින හැඳුනුම්පත වෙනුවට විද්‍යුත් ජාතික හැඳුනුම්පත පදනම්කරගෙන නව හැඳුනුම්පත නිකුත් කිරීම.** | 5.1 ICAO නව මෘදුකාංගය මිලදී ගෙන දිවයිනපුරා පිහිටි දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඡායාරූප ශාලා සඳහා ලබා දී ඇත. |
| | 5.2.1.නව මෘදුකාංගය පිළිබඳව ඡායාරූප ශිල්පීන් 2072 ක් තෝරාගෙන අදාළ පුහුණු කිරීමේ කටයුතු අවසන් කර ඇත.<br><br>5.2.2. ICAO නව මෘදුකාංගයහරහා මාර්ගගතව (Online) ජායාරූපලබා ගැනීම බස්නාහිර හා සබරගමුව පළාත් වල 2018.12.17 දින සිට ආරම්භ කරන ලද අතර 2019.01.01 දින සිට දිවයිනේ අනෙකුත් සියළුම පළාත් ආවරණය වන පරිදි එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. |
| | 5.3.1. පෙර මුද්‍රිත කාඩ්පත් මිලියනයක් මිලදී ගෙන ඇති අතර ජාතික හැඳුනුම්පත සිංහල , දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සුහුරුකාඩ් පතක මුද්‍රණය කර 2017.10.27 දින සිට නිකුත්කිරීම ආරම්භකර ඇත.<br><br>5.3.2. පෙර මුද්‍රිත කාඩ්පත් ලක්ෂපහක් 2018.08.23 දින මිලදී ගෙන ඇත. තවද, පෙර මුද්‍රිත කාඩ්පත් මිලියන පහක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීම 2018.12.17 දින පල කරන ලද අතර ලංසු විවෘත කිරීම 2019.02.18 දින සිදු කිරීමට නියමිතව ඇත. |
| **6.පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය බත්තරමුල්ලේ පිහිටි "සුහුරුපාය" ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කිරීම.** | 6.1 විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම සඳහා වූ නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන පහසුකම් සහිතව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය බත්තරමුල්ලේ පිහිටි "සුහුරුපාය" ගොඩනැගිල්ල තුළ 2016.09.27 දින ස්ථාපිත කරන ලදී. |

| | |
|---|---|
| 7. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | **7.1 විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීමට අදාල මෘදුකාංගය මිලදී ගැනීම සඳහා අදාල ටෙන්ඩර් ලියවිලි සකස් කර ඇත.** |
| | 7.2 දත්ත මධ්‍යස්ථානය, ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානය හා මෙහෙයුම් ඒකකය සඳහා දෘඩාංග මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරමින් පවතී. |
| | 7.3 දෙපාර්තමේන්තුවේ පවතින සර්වර් පද්ධතිය නවීකරණය කර හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට පියවර ගෙන ඇත. |

| | |
|---|---|
| **8. විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘති සැලැස්ම දෙපාර්තමේන්තු අවශ්‍යතාවයට අනුව සංශෝධනය කිරීම** | 8.1 2018.01.26 දින පැවති ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේදී ගන්නා ලද තීරණයකට අනුව දැනට පවතින ව්‍යාපෘති සැලැස්ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට අනුව සංශෝධනය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් උපදේශක වරයෙකු තෝරාගෙන, සංශෝධන වාර්තාව සකසා 2018.09.25 දින ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ යෝජනා සහිත නව වාර්තාව මේ වනවිට ව්‍යාපෘතිය වෙත ලැබී ඇත. |
| **9. දත්ත රැස්කිරීමේ වැඩසටහන** | 9.1 2014.07.10 දින ලබාදුන් ජනාධිපති මෙහෙයුම් කමිටුවේ අනුමැතිය අනුව මූලික දත්ත රැස්කිරීමේ නියමු පියවර දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 27ක 2014 සැප්තැම්බර් මස ආරම්භකර මේ වන විට අවසන්කර ඇත. |
| | 9.2 දත්ත රැස්කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන 2019 වර්ෂයේ මුල් භාගයතුල ආරම්භ කිරීමට නියමිතව ඇත. |
| **10. දත්ත විද්‍යුත්කරණය** | 10.1 දත්ත විද්‍යුත්කරණය කිරීම (Data Digitization) 2019 වර්ෂයේ මුල් භාගයතුල ආරම්භ කිරීමට නියමිතව ඇත. |
| **11. ජාතික පුද්ගල නාමලේඛනය ස්ථාපිත කිරීම** | 11.1 ජාතික පුද්ගල නාමලේඛනය ස්ථාපිත කිරීම 2019 වසරේ අවසන් කාර්තුව තුලදී සිදුකිරීමට සැලසුම් කර ඇති අතර, ඒ අනුව දත්ත සත්‍යාපනය හා හුවමාරු කිරීමේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කිරීමට නියමිතය. |

**වගුව 13: 2018 වසරේ ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය**